සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අනාවරණ පරීක්ෂණය 2021

6 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

කාලය පැය 2 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක් නොවන්නේ,

(1) කඳු කඳු නැගෙනා (2) පොත පත කියවා නුවණ ලබා
(3) මුණි සිරිපාදේ (4) බැතිනා සිරිපා

02 අළුව (Bow) ආධාරයෙන් වයන සංගීත භාණ්ඩ දෙකකි,

(1) සිතාරය , ගිටාරය (2) වයලීනය, එස්රාජය
(3) වයලීනය, ඕගනය (4) මැන්ඩලීනය, වයලීනය

03 අමීර් කුශ්රූ පඬිතුමා විසින් නිෂ්පාදිත තාල වාද්‍ය භාණ්ඩය වනුයේ,

(1) ටැම්බරින් (2) සිතාරය (3) තබ්ලාව (4) මද්දලය

04 සිංහල ජන ක්‍රීඩා ආශ්‍රිතව නිර්මාණය වූ ගී වනුයේ,

(1) නාට්‍ය ගී (2) ගැමි ගී (3) සරල ගී (4) කෙළි ගී

05 භාරතීය සංගීතයේ ප්‍රධාන සංගීත පද්ධති දෙක වනුයේ,

(1) දේශීය හා අපරදිග සංගීත පද්ධතියයි. (2) පෙරදිග හා අපරදිග සංගීත පද්ධතියයි.
(3) බටහිර හා අපරදිග සංගීත පද්ධතියයි. (4) හින්දුස්ථානී හා කර්ණාටක සංගීත පද්ධතියයි.

- අංක 06 - 10 දක්වා ප්‍රශ්න සඳහා ගැලපෙන පිළිතුර තෝරා යා කරන්න.

| | | |
|---|---|---|
| 06 | තත් 8 කින් සමන්විතය | • තුන්සරණේ ගී |
| 07 | බැතිනා සිරිපා කරුණා කරනා | • ස රි ග ම ප ධ නි ස් |
| 08 | මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ | • මැන්ඩලින් |
| 09 | ආරෝහණ ස්වර | • ශුද්ධ ස්වර ස්ථාපන ගී |
| 10 | සීත ගඟුලෙදි ඇඳ පේ වෙනවා | • නූර්ති ගී |

- අංක 11 - 15 දක්වා ඇති ප්‍රශ්න සඳහා වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.

(නාද/ 03/ බටහිර / දයානන්ද ගුණවර්ධන මහතා/ යටින් ඉරක්)

11 කෝමල ස්වර හඳුනා ගැනීම සඳහා ස්වරයට ............................................................ අඳිනු ලැබේ.

12 ප්ලුත මාත්‍රාවක වටිනාකම ............................................ කි.

13 නරිබෑනා නාට්‍යයේ නිර්මාතෘ වන්නේ ............................................................................................ ය.

14 සංගීතයේ මාධ්‍ය වන්නේ ........................................................................ යයි.

15 CDEFGAB ලෙස ස්වර දැක්වෙන්නේ ................................................................ සංගීත ක්‍රමයේ ය.

- **අංක 16 - 20 දක්වා ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

16 හොඳ දේ සිතමී යන ස්වර ස්ථාපන ගීතය ස සිට රි දක්වා ස්වර විහිදේ. ( )

17 එස්රාජ් නැමති සංගීත භාණ්ඩය ඉන්දියාවේ බෙංගාල ප්‍රදේශයේ ප්‍රචලිත වේ. ( )

18 දිල්රුබාව නැමති සංගීත භාණ්ඩය පික් එකක් ආධාරයෙන් වාදනය කරයි. ( )

19 ''උඩ පල ගත්තත් වට්ටක්කා'' රබන් ගීතයකි. ( )

20 මේ රට මගෙ රට යන ගීතය මාත්‍රා 4 න් 4 ට විභාග වේ. ( )

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01 (i) ස්වර පුවරුවක් ඇඳ ස්වර සප්තකය එහි සටහන් කරන්න. (ල. 04)

(ii) ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 06)

02 (i) සිංහල ජන ක්‍රීඩා ආශ්‍රිත ගී පිළිබඳ කරුණු 03ක් ලියන්න. (ල. 03)

(ii) සිංහල ජන ක්‍රීඩා ආශ්‍රිතව ගායනා කළ ගී වර්ග 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) කාන්තාවන්ට සුවිශේෂ වූ ජන ක්‍රීඩාවකට අයත් කවියක පද 04 ක් ලියන්න. (ල. 04)

03 (i) ළමා ගීතයක දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(ii) ළමා ගීත රචකයින් තිදෙනෙකු නම් කරන්න. (ල. 03)

(iii) ප්‍රචලිත ළමා ගීතයක පද මාලාව ලියා දක්වන්න. (ල. 04)

04 (i) ''සීතල පිණිබිඳු දසත හමා යන'' ඉහත ගී පාදය සුදුසු තාලයකට අනුව ප්‍රස්තාර කරන්න. (ල. 03)

(ii) ඉහත ගී පාදයේ ඇති ලඝු අක්ෂර හා ගුරු අක්ෂර වෙන් කොට ලියා දක්වන්න. (ල. 03)

(iii) මාත්‍රා 3 ට අයත් රිද්ම රටාවක් ප්‍රස්තාර කරන්න. (ල. 04)

05 (i) නූර්ති ගීතවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 3 ක් ලියා දක්වන්න. (ල. 03)

(ii) ඔබ දන්නා නූර්ති ගීතයක පද මාලාව ලියා දක්වන්න. (ල. 04)

(iii) නූර්ති ගීත රචකයින් තිදෙනෙකු නම් කරන්න. (ල. 03)

(ලකුණු 3 x 10 = 30)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අනාවරණ පරීක්ෂණය 2021
# පෙරදිග සංගීතය

6 ශ්‍රේණිය

## ප්‍රායෝගික පරීක්ෂණය

01 ඔබ කැමති ස්වර ස්ථාපන ගීතයක් ගායනය / වාදනය කරන්න. (ලකුණු 10)

02 ඔබ කැමති නූර්ති ගීතයක් ගායනය / වාදනය කරන්න. (ලකුණු 10)

03 ඔබ කැමති ස්වර අභ්‍යාසයක් ගායනය / වාදනය කරන්න. (ලකුණු 10)

04 ඔබ කැමති කෙළි ගීතයක් ගායනය කරන්න. (ලකුණු 10)

05 ඔබ කැමති සංගීත භාණ්ඩයකින් ස්වර සප්තකය වාදනය කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 50)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 02 | 2 | 03 | 3 | 04 | 4 | 05 | 4 | 06 | මැන්ඩලින් | 07 | ශුද්ධ ස්වර ස්ථාපන ගී |
| 08 | නූර්ති ගී | 09 | ස රි ග ම ප ධ නි සं | | | | | 10 | තුන් සරණේ ගී | 11 | යටින් ඉරක් | | |
| 12 | 3 කි | 13 | දයානන්ද ගුණවර්ධන මහතා | | | 14 | නාදයයි | 15 | බටහිර | 16 | ✓ | | |
| 17 | ✓ | 18 | ✗ | 19 | ✗ | 20 | ✓ | | | | | | |

(1 x 20 = 20)

## II කොටස

01 (i) ස්වර පුවරුව ඇඳ ශුද්ධ ස්වර සප්තකය ලකුණු කර තිබිය යුතුය. (ල. 04)

(ii) 6 ශ්‍රේණියට අදාල විෂය නිර්දේශයේ ඇති ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කළ යුතුය. (බැතිනා සිරිපා, මුනි සිරිපාදේ, කඳුපෙළ අතරේ, ඈත හිමේ ගිරි මුදුනේ, කඳු කඳු නැඟෙනා, එකට සතුටු සාගරේ, ගී ගයන ආදී ගීත වලින් එකක්) (ල. 06)

02 (i) ගීත තාලානුකූල වේ.
විනෝදාස්වාදය සඳහා නිර්මාණය වී ඇත.
සිංහල ජන ක්‍රීඩා ආශ්‍රිතව නිර්මාණය වී ඇත. (ල. 03)

(ii) එළුවන් කෑම, මේවර කෙළිය, පනා හැංගීම, කළගෙඩි කවි ආදී ලෙස (ල. 03)

(iii) මේවර කෙළියේ ගීතයක් හෝ ඔළිඳ කෙළියේ ගීතයක් (ල. 04)

03 (i) ළමුන්ට ගැලපෙන තේමාවලින් යුක්ත වීම.
පද මාලා සරල වීම.
නාද මාලා සරල වීම. (ල. 03)

(ii) ආනන්ද රාජකරුණා මහතා — මුණිදාස කුමාරතුංග මහතා
ඩබ්ලිව්. ඒ. අබේසිංහ මහතා — එස් . මහින්ද හිමි (ල. 03)
අරිසෙන් අහුබුදු මහතා

(iii) ළමා ගීතයක පද මාලාව ලියා දැක්වීම (ල. 04)

04 (i)

| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සී | s | ත | ල | පි | ණි | බි | ඳු | ද | ස | ත | හ | මා | s | ය | න |

(ල. 03)

(ii) ලඝු අක්ෂර - ත ල පි ණි බි ඳු ද ස ත හ ය න (ල. 03)
ගුරු අක්ෂර - සී මා

(iii)

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| x | - | - | x | - | - | x | - | - | x | - | - |

(ල. 04)

මාත්‍රා 3 ට ගැලපෙන රිද්ම රටාවක්

05 (i) ගීතවල දොහොරාව නැමති කොටසක් ඇත.
තබ්ලාව හා සර්පිනා වාදනයේ දී යොදා ගැනෙයි.
තාලානුකූලයි.
ස්ථායී, අන්තරා කොටස් ඇත. (ල. 03)

(ii) නූර්ති ගීතයක පද මාලාව ලියා දැක්වීම. (ල. 04)

(iii) සී. දොන් බස්තියන් මහතා
චාල්ස් ඩයස් මහතා
ජෝන් ද සිල්වා ගුරුන් (ල. 03)